ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1906/12 - 2015 මාර්තු මස 17 වැනි අඟහරුවාදා - 2015.03.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්පත් කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය) 7 වෙනි වගන්තිය යටතේ දැන්වීම**

*ප්‍රදේශීය ලේකම්ගේ අංකය* : වෙන්/ප්‍රලේ/ඉඅත්/98/5(11).
*ඉඩම් අමාත්‍යංශයේ යොමු අංකය* : LD/05/2006/E/191.

හලා/වෙන් /සාන්ත රීටා (තල්දෙක) කණිෂ්ඨ විද්‍යාලය සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (01) වන උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර :*

වයඹ පළාතේ පුත්තලම දිස්ත්‍රික්කයේ වෙන්නප්පුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කම්මල් පත්තුව සුළු කොට්ඨාශයේ තල්දෙක ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක මු.පි. පු. 4950 පිඹුරේ කැබලි අංක 01 වශයෙන් සඳහන් ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.2020 ක් වන මාදන්ගහවත්ත නැමති ඉඩම් කැබැල්ල.

*ඉඩමේ නම*: මාදන්ගහවත්ත; හිමිකම් කියන අය: එච්. ඒ. ඩී. එම්. එම්. අයිරාංගනී; ප්‍රමාණය: හෙක්ටයාර් : 0.2020.

*මහජන කටයුත්ත කුමක්ද යන වග*: හලා/වෙන්/ සාන්ත රීටා (තල්දෙක) කණිෂ්ඨ විද්‍යාලය සඳහා ඉඩම් අත්පත් කරගැනීම. ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තමතමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2015.04.08 දින පෙ.ව.10.30ට වෙන්නප්පුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2015.04.01 දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම් වල ස්වභාවයක් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ සැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

යූ. එස්. එන්. ප්‍රනාන්දු
ප්‍රාදේශීය ලේකම්,
වෙන්නප්පුව.

2015 පෙබරවාරි මස 23 වැනි දින
වෙන්නප්පුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

04-45